# කේන්ද්‍රයෙන් කියැවෙන ඔබේ සහකරු සහකාරිය

ධම්මික විජේසිංහ
සුබෝධා ජ්‍යොතිශ සේවය - මෙල්බර්න්

ඔබේ කේන්ද්‍රයේ හත් වැන්න ඔබේ විවාහයට වැඩිම බලපෑමක් ඇතිකරන ස්ථානයයි. ජ්‍යොතිශ සිද්ධාන්ත ඉදිරිපත් කල ආචාරීන් විසින් හත්වැන්නට අධිපති ග්‍රහයාගේ පිහිටීම, එම ග්‍රහයා සම්බන්ධ වන යෝග, සංයෝග දෘෂ්ටි හා කාරක අනුව විවාහය සිදුවන ආකාරය හා විවාහ සහකරුගේ ස්වභාවය, ඔහු සිටින දිශාව, තත්වය වැනි බොහෝ දෑ දක්වා ඇත. ග්‍රහයන්ගේ බල දුබලතා අනුව මඳක් වෙනස් කම් ඇතත් එකී විස්තර බොහෝ දුරට නිවැරදි වේ.

මුලින්ම ඔබේ කේන්ද්‍රයේ හත අධිපති ග්‍රහයා කවුරුන්ද යන්න හඳුනාගනිමු. ඔබේ ලග්නය අනුව හත අධිපති ග්‍රහයා පහත වගුවෙන් බලාගන්න.

| **ලග්නය** | **හත අධිපති** |
|---|---|
| මේෂ | සිකුරු හෙවත් ශුක්‍ර (ශු) |
| වෘෂභ | කුජ හෙවත් අඟහරු |
| මිථුන | ගුරු හෙවත් බ්‍රහස්පති |
| කටක | ශනි හෙවත් සෙනසුරු |
| සිංහ | ශනි හෙවත් සෙනසුරු |
| කන්‍යා | ගුරු හෙවත් බ්‍රහස්පති |
| තුලා | කුජ හෙවත් අඟහරු |
| වෘශ්චික | සිකුරු හෙවත් ශුක්‍ර |
| ධනු | බුධ |
| මකර | සඳු හෙවත් චන්ද්‍රයා |
| කුම්භ | රවි හෙවත් සූර්‍යයා |
| මීන | බුධ |

දැන් හත අධිපති ග්‍රහයා සිටින ස්ථානය අනුව පහත දැක්වෙන පරිදි විස්තර දැනගන්න.

**හත අධිපතියා**

1) ලග්නයේ නම් තමන්ගේ අදහස් උදහස් පිලිගන්නා අයෙකි. සෙනසුරු හෝ අඟහරු වැනි පාපග්‍රහයෙක් නම් ඔබේ විවාහය මඳක් ප්‍රමාද විය හැක.

2) දෙවැන්නේ නම් ධනවත් සහකරුවෙක් හෝ සහකාරියක් ලැබේ. විවාහයෙන් පසු ආර්ථික තත්වය පෙර සිටියාට වඩා දියුණුවේ. නමුත් කල් ගත වන විට දෙදෙනා අතර බැඳීම අඩුවන බව කියා ඇත.

3) තුනේ නම් ප්‍රසිද්ධ, වික්‍රමාන්විත කෙනෙකි.



විවාහයෙන් පසු ජීවන තත්වයේ බොහෝ වෙනස්කම් යෙදේ.

4) හතරේ නම් ගේ දොර, ඉඩකඩම්, දේපළ ඇති අයෙකු ලැබේ. විවාහයෙන් පසු දෙදෙනාගේ සම්බන්ධය වඩාත් වැඩි දියුණුවේ.

5) පහේ නම් අධ්‍යාපනය ලබන ස්ථානයකින් ඇතිවන සම්බන්ධයකින් විවාහය සිදුවේ. උගත් අයෙකි. නමුත් දෙපාර්ශවයේ ඥාතීන් අතර ප්‍රශ්ණ ගැටළු ඇතිවිය හැක.

6) හයේ නම් වැඩි තොරතුරු නොදන්නා දුර බැහැර අයෙක් සමග විවාහය සිදුවේ. සහකරු හෝ සහකාරියගේ වංචා අසනීප වැනි දුර්වලතා පසුව හෙලිවේ. කල් ගත වන විට දෙදෙනා අතර මත භේද ප්‍රශ්ණ ඇතිවිය හැක.

7) හතේ නම් තමාගේ සිතට ගැලපෙන කෙනෙකු ලැබේ. අන්‍යෝන්‍ය වශයෙන් ගෞරවයක් බැඳීමක් ඇතිවේ. විවාහයට මුල් තැන දී කටයුතු කරයි. නමුත් ග්‍රහයා කුජ හෝ ශනි වැනි පාපියෙකු නම් ඉහත කී සුභ දායක තත්වය අඩුවේ.

8) අටේ නම් ශරීර ශක්තිය අඩු ධෛර්‍යය උත්සාහය අඩු අයෙක් විවාහයට ලැබේ. නමුත් ඔහුගේ හෝ ඇයගේ ධනයෙන් තමාට යැපීමට ඉඩ සැලසේ.




9) නමයේ නම් ගුණ යහපත් වාසනාවන්ත කෙනෙක් හා විවාහය යෙදේ. නමුත් දෙදෙනා අතර කායික ඇසුර බොහෝ දුරට අඩුවිය හැකිය.

10) දහයේ නම් රැකියාව හේතුවෙන් විවාහය යෙදීමට ඇති ඉඩකඩ වැඩිය. රැකියාවක නියුතු කාර්යක්ෂම කෙනෙකු ලැබේ.

11) එකොලහේ නම් නිතර ආදායම් ලබන කෙනෙකු සමඟ වේ. කලක් ඇසුරින් පසු විවාහය සිදුවේ. සහකරු හෝ සහකාරිය ඉබේටම මෙන් තමා කරා පැමිණේ. පෙර ආත්මගත සම්බන්ධයක් අනුව සිදුවන විවාහයක් වීමට ඉඩ ඇත.

12) දොළහේ නම් තත්වයෙන් හෝ දියුණුවෙන් අඩු, දුර බැහැර ප්‍රදේශයක කෙනෙක් සමඟ සිදුවන විවාහයකි. විවාහයෙන් පසු තමා නිසා ඔහුට හෝ ඇයට බොහෝ වියදම් යෙදේ.

ඉහත කී තොරතුරු අනුව ඔබේ සහකරු හෝ සහකාරියගේ තතු ඔබටම පරීක්ෂා කර බැලිය හැක. දැනටමත් විවාහක නම් මෙහි සඳහන් අයුරු අයෙක් තමාට ලැබී ඇත්දැයි යනුවෙන්ද බලාගත හැක. ඔබ දෙමාපියෙක් හෝ වැඩිහිටි අයෙක් නම් ඔබේ දරුවන්ගේ හෝ භාරයේ සිටින දරුවන්ගේ විවාහ සහකරු හෝ සහකාරිය හඳුනාගෙන සිටීම වැදගත් වනු නොඅනුමානය. ■


# Keilor medical clinic

## Bulk billing (GP clinic)

Female and Male doctors Available



- Family medicine & Women's Health
- Travel Vaccination
- Flu Vaccine
- Physiotherapy
- Onsite pathology services

**Call us today for an appointment**
**No Waiting Time**

**03 94494655**
**870 Old Calder Hwy,**
**Keilor, Vic 3036**

**Open 7 days till late night**
**Monday – Friday : 8:30am – 10:00pm**
**Saturday and Sunday: 8:30am – 6:00pm**

**Dr.Kingsley Joseph**
වෛද්‍ය කිංස්ලි ජෝසප් මහතා
General Practitioner

**Dr.Ivan S.Senanayake**
වෛද්‍ය අයිවන් සේනානායක මහතා
General Practitioner

**Dr.Satya Inumala**
වෛද්‍ය සත්‍යා මහත්මිය
General Practitioner

**Dr. Ransimala Samarakoon**
වෛද්‍ය රන්සිමාලා සමරකෝන් මහත්මිය
General Practitioner

**Dr. Saliya Kumarasinghe**
වෛද්‍ය සාලිය කුමාරසිංහ මහතා
General Practitioner

**Dr. Hiran Fernando**
වෛද්‍ය හිරාන් ප්‍රනාන්දු මහතා
General Practitioner

friendly staff and high end technology to treat patients.
Overseas students and visitors who has insurance to claim the whole amount back
There is no gap payment.

In addition , The principal GP, Dr.Kingsle Joseph serve our community in following locations

1 .Alpha Medical Clinic
351 Childs Rd Mill Park
03 94044888

2 Wells Medical Clinic
176, Blair Street Broadmedows
03 93021580